**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය - 2023**

**-------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාංශය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාංශයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාව, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාංශයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කාර්යාංශය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 36 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළදී කාර්යංශයේ දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර තිබුණද විදේශ දූත මණ්ඩල කාර්යාලවල පවතින පිරිවැය රු.447,392,585ක් වූ දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | විදේශ දූත මණ්ඩල සතු දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර අවසන් කිරීමට නොහැකි වූයේ එම කටයුතු නව අත්දැකීමක් වශයෙන් අදාළ රටවල සේවා සපයන්නන් වෙතින් සිදු කිරීමට උත්සාහ කිරීමේදී එය අසාර්ථක වූ අතර ඒ සඳහා නැවත ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ආරම්භ කිරීමට සිදු වූ බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 හි 15 වන පරිච්ඡේදය අනුව ආදායම් බදු ගණනයේදී බදු සඳහා තාවකාලික වෙනසක් නිර්මාණය නොවන (ස්ථාවර වෙනසක්) මෝටර් වාහන 25 ක භාවිත අයිතිය වත්කම් ලෙස හඳුනාගෙන ඊට අදාලව වත්කමේ ධාරණ අගය හා කල්බදු වගකීම අතර වෙනස විලම්භිත බදු වගකීම ලෙස රු.106,761,454 ක් ගණනය කිරීම හා 2016/17 කාල පරිච්ඡේදයට අදාළව අත්පත් කරගෙන තිබූ අස්පෘශ්‍ය වත්කම් වෙනුවෙන් ප්‍රවර්තන වර්ෂයේදී විලම්භිත බදු වගකීම ලෙස රු.4,115,886 ක් ගණනය කිරීම හේතුවෙන් එකතුව රු.110,877,340 කින් විලම්භිත බදු වගකීම අධි තක්සේරු වී තිබුණි. | විගණනයෙන් පෙන්වා දෙන කරුණු නිවැරදි වේ. ඉදිරියේදී නිවැරදිව ගැලපීම් සිදු කරනු ලබන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 හි 80 (බී) වගන්තිය අනුව 2022/23 තක්සේරු වර්ෂයට අදාළව රු.286,520,680ක් වූ බදු අධි වෙන්කිරීම ප්‍රවර්තන වර්ෂයේ බදු වියදමින් අඩුකළ යුතු වුවත් ප්‍රවර්තන වර්ෂයේ බදු ගෙවීම් වලට එම අගය එකතු කිරීම හේතුවෙන් වර්ෂයේ බදු වියදම එම අගයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි . | ප්‍රවර්තන වර්ෂයේ ආදායම් බදු අධි තක්සේරුවක් පැවතියද එමගින් සමස්තයක් වශයෙන් ගත් විට බදු සඳහා බලපෑමක් සිදු වී නොමැත. මෙවැනි වර්ගයේ ගැලපීම් ඉදිරියේදී නිවැරදි කරන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව බදු ගණනය නිවැරදිව දැක්විය යුතුය. |
| (ඈ) | උක්ත ප්‍රමිතයේ 88 වන වගන්තිය අනුව , බදු අධිකාරීන් සමග පවතින නොවිසඳුනු ආරවුල් (unresolved dispute) සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශයන්හි හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙය ඉදිරියේ දි නිවැරදි කරනු ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුව බදු ගණනයට අදාළ තොරතුරු හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07 හි 20 ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන අයිතමයන් බදු පෙර ලාභයට ගැලපිය යුතු වුවත්, කාර්යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී ආදායමට ගෙන තිබූ පෙර වර්ෂයන්ට අදාළ ගෙවිය යුතු රු.1,388,788,991 ක් බදු පෙර ලාභයට ගලපා නොතිබීම හා වර්ෂයේ ආදායම් බදු සඳහා වූ තත්‍ය වියදම රු.226,778,807ක් වැඩියෙන් දක්වා තිබීම හේතුවෙන් මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු.1,615,567,798ක් වැඩියෙන් දක්වා තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදලට සිදුකරන ලද එකතුව රු.132,814,814 ක ගැලපීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ බදු පෙර ලාභයට එකතු කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ මුදල් ප්‍රවාහය වැඩියෙන් දක්වා තිබුණි. | විගණනයෙන් පෙන්වා දෙන පරිදි මුදල් ප්‍රවාහ වෙනස රු.97,788,637ක් ලෙස නිවැරදි විය යුතුය. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වටිනාකමක් සටහන් තබා ඇත්තේ බදු ගෙවීමේ ගිණුමේ සමාලෝචිත වසරට අදාළ බදු වෙන් කිරීම ඉවත් කිරීමෙන් පසු ඉතිරි ශේෂය රු.1,732,042,234ක් විය. ඉදිරියේදී අදාළ ගැලපුම් සිදුකිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කළ යුතුය. |
| (ඊ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන ගැලපීම් යටතේ රු.1,670,958,783 ක් වූ වෙනත් ලැබිය යුතු දෑ වැඩිවීම මුදල් ගලා යාමක් ලෙස හඳුනා ගත යුතු වුවත් කාර්යාංශය විසින් මුදල් ගලා ඒමක් ලෙස රු.292,206,413 ක් හඳුනා ගැනීම හේතුවෙන් මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු.1,963,165,196 ක් වැඩියෙන් දක්වා තිබුණි. | විගණනයෙන් පෙන්වා දෙන පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන ගැලපීම් යටතේ රු.1,670,958,783ක මුදල් ගලායාමක් ලෙස සඳහන් කල ද, එය රු.292,206,413ක මුදල් ගලා ඒමක් ලෙස නිවැරදි විය යුතුය. ඊට හේතුව වනුයේ ඉහත සඳහන් වටිනාකමින් රු.මිලියන 26ක හෝමාගම ඉඩමට අදාල ගැලපීමක් ඇති අතර එය කාර්යාංශයෙන් මුදල් ගලා නොයෑමකි. රු.1,937,544,813 ක ලැබිය යුතු පොලී ආදායම ගැලපීමත්, උපලබ්ධි නොවූ විදේශ විනිමය ලාභය රු.379,617ක වටිනාකමක් ගැලපීම තුළින් රු.292,206,413ක වටිනාකම නිරූපණය වී ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුව වර්ෂය තුළදී මුදලින් සිදුවූ ගලාඒම් සහ ගලායාම් නිශ්චිතව හඳුනාගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන ගැලපීම් යටතේ විවිධ ණය හිමියන්ගේ රු.1,184,188,776ක අඩුවීම රු.1,860,049,996 ක් ලෙස ගැලපීම හේතුවෙන් හා විලම්භිත බදු ගැලපීම් රු.4,010,206 ක් මුදල් ගලායෑමක් ලෙස හඳුනා ගැනීම හේතුවෙන් මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු.679,871,426 ක් අඩුවෙන් දක්වා තිබුණි. | කාරක ප්‍රාග්ධනය ගැලපීම් යටතේ විවිධ ණය හිමියන්ගේ රු.1,844,776 අඩු වීම මූල්‍ය ප්‍රකාශන තුළ රු.1,860,049,996 මුදල් ගලා යාමක් ලෙස හඳුනා ගැනීමට හේතුව වූයේ විවිධ ණය හිමියන් තුළ උපලබ්ධි නොවූ විදේශ හුවමාරු අවාසි රු.675,861,220 ක් ගිණුම්ගත වී ඇති බැවිනි. කාරක ප්‍රාග්ධනය ගැලපීම යටතේ විලම්භිත බදු ගැලපීම රු.4,010,206ක් මුදල් ගලා යාමක් ලෙස සටහන් තබා ඇත්තේ බදු පෙර ලාභය තුළ එය මුදල් ගලා ඒමක් ලෙස සටහන් වී ඇති බැවිනි. ඉදිරියේදී අදාල ගැලපුම් සිදුකිරීමට කටයුතු කරන බව. | වර්ෂය තුළදී මුදලින් සිදුවූ ගලාඒම් සහ ගලායාම් නිශ්චිතව හඳුනාගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාර්යාංශය සතු දඹුල්ල ඉඩම සහ වර්ෂ 50 ක බදු පදනම මත ලබාගෙන තිබූ හෝමාගම ඉඩම ප්‍රත්‍යාගණනය කර නොතිබියදී, එම ඉඩම්වල පිරිවැය වූ රු.68,000,000 ක් හා සමුච්චිත ක්ෂය රු.18,029,749ක් ප්‍රත්‍යාගණනය සංචිත ගිණුමට පිළිවෙලින් හර හා බැර කර තිබීම හේතුවෙන් ප්‍රත්‍යාගණනය සංචිත ගිණුමේ ශේෂය හා ඉඩම්වල වටිනාකම රු.49,970,251ක් අඩුවෙන් දක්වා තිබුණි. | හෝමාගම ඉඩමෙහි කොටසක් ලංකා විදුලිබල මණ්ඩලය වෙත ලබා දීමට නාගරික සංවර්ධන අධිකාරිය කටයුතු කරමින් පවතින අතර ඒ වෙනුවට වෙනත් ඉඩමක් කාර්යාංශය වෙත ලබා දීමට කටයුතු කරමින් පවතින බැවින් ප්‍රත්‍යාගණනයක් සිදු නොකල බව. දඹුල්ල විගමණික මධ්‍යස්ථානයට අයත් ඉඩමේ ඔප්පුවේ සහ පිඹුරුපතෙහි පැවැති දෝෂයක් හේතුවෙන් මේ සඳහා ප්‍රත්‍යාගණනය සිදු නොකල අතර නීති උපදෙස් ලබාගෙන අදාළ නිරාකරණයන් සිදුකිරිමෙන් පසුව ප්‍රත්‍යාගණනය සිදුකරනු ලබන බව. | කාර්යාංශය සතු ඉඩම්වල වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කුවේට් වන්දි අරමුදලේ ස්ථාවර තැන්පත්වලට අදාල විදේශ මුදල් හුවමාරු අලාභය විගණනයේ ගණනය කිරීම අනුව රු.513,141,327ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනයේ එය රු.511,622,072 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් කුවේට් වන්දි අරමුදලේ ශේෂය හා කුවේට් වන්දි ස්ථාවර තැන්පතුවල ශේෂය රු.1,519,255 ක් වැඩියෙන් දක්වා තිබුණි. | කාර්යාංශය විසින් කුවේට් අරමුදලට අදාළව ගණනය කරන ලද විදේශ විනිමය හුවමාරු අලාභය රු.526,054,566ක වටිනාකම නිවැරදි බව. | අදාළ දිනයන්හි පවතින විදේශ විනිමය හුවමාරු අනුපාතය පදනම් කරගෙන ලාභය හෝ පාඩුව ගණනය කර ගිණුම් ගත කළ යුතුය. |
| (ඇ) | 2014 නොවැම්බර් 24 දින සිට 2021 මාර්තු 09 දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් කුවේට්හි කම්කරු සුභසාධන අංශයට අදාළව ගෙවිය යුතු (කුවේට් ඩිනාර් 41,130.373 ක්) රු.43,310,283ක ජල බිල්පත් ගිණුම්ගත කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන අවස්ථාවේදී අදාළ බැරකම පිළිබඳ නිශ්චිත අගයක් හඳුනා ගෙන නොතිබුණු බැවින් ගිණුම්ගත කිරීමක් සිදු කර නොමැති බව. | කාර්යාංශයේ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | විදේශ රැකියා නියෝජිත ආයතන වෙත ගෙවිය යුතු ණයහිමි ශේෂ | 373,132,590 | ශේෂ තහවුරු කිරීමේ ලිපිවල බලපත්‍රලාභියාගේ ලියාපදිංචි අංක හෝ ආයතනයේ නම සටහන් කර නොතිබීම. | ඉදිරියේදී ශේෂ තහවුරු කිරීම් ලිපි යොමු කිරීමේදී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර අදාළ ආකෘති පත්‍රය සැකසීමට කටයුතු සිදු කරන බව. | බලපත්‍රලාභියා හඳුනාගත හැකි පරිදි ශේෂ තහවුරු කිරීමේ ලිපි විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ශේෂ | 869,955,802 | ශේෂ තහවුරු ලිපි | මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල සම්බන්ධයෙන් 2024.04.08 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් යොමු කළ ලිපියට අනුව කටයුතු කිරීම සඳහා 2024.05.09 දින සාමාන්‍යාධිකාරිතුමාගේ අත්සනින් විදේශ රැකියා අමාත්‍යාංශය හරහා විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර ඇති බව. | විධිමත්ව ශේෂ තහවුරු කිරීම් විගණනය වෙත ලබා දීමට කටයුතු කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දීර්ඝ කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ලැබිය යුතු විවිධ තැන්පතු යටතේ පැවති රු.1,000,000 ක ශේෂය විධිමත් අනුමැතියකින් තොරව සමුච්චිත අරමුදලට හර හා බැර කර තිබුණි. | කාර්යාංශයේ ගිණුම්වල සඳහන් ලැබිය යුතු ශේෂයන් පරීක්ෂා කිරීමේදී රු.මිලියනයක මුදලක් ලැබිය යුතු ශේෂයක් තිබූ බැවින් 2023 වර්ෂයේ ගිණුම් වලට මෙම අගය ලියා හැරීම සිදු කර ඇති බව. | විධිමත් අනුමැතියකින් පසු සමුච්චිත අරමුදලට ගැලපීම් සිදු කළ යුතුය. |

### 1.6.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2008 සිට 2018 දක්වා කාලපරිච්ඡේදයට අදාල එකතුව රු.1,388,788,991ක් වූ ගෙවිය යුතු ශේෂ විධිමත් අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී ආදායමට ගෙන තිබුණි. | 2023 පෙබරවාරි 26 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට අනුව වසර 5 ඉක්මවා තිබූ සියලු ගෙවිය යුතු ශේෂයන් ආදායමට ගැනීමට අනුමැතිය ලැබී තිබුණු අතර 2023 වර්ෂයේදී ගැලපීම් සිදු කරන ලදි. | ගෙවිය යුතු ශේෂ ආදායමට ගැනීමට පෙර අදාළ පාර්ශ්වයන් දැනුවත් කිරීමට සෑම උත්සාහයක්ම ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දකුණු කොරියාවේ ධීවර අංශයේ රැකියාවක නියුතුව සිටි ශ්‍රමිකයෙකු 2019 ඔක්තෝබර් 08 දින අනතුරකට පත්වීම හේතුවෙන් ඔහු මෙරටට ගෙන්වා ගැනීම සඳහා සහෝදරයා විසින් රු.1,564,546ක් කාර්යාංශයේ තැන්පත් කර තිබියදී, මොහු ශ්‍රී ලංකාවට නැවත එවීමට හා රෝහල් බිල පියවීම සඳහා කම්කරු සුභසාධන අංශයේ නිලධාරියෙකු විසින් ඔහුගේ එරට බැංකු ගිණුම්හි තැන්පත් මුදල් භාවිතා කර තිබුණි. තවද, කම්කරු සුභසාධන අංශයේ නිලධාරියෙකුගේ ණය කාඩ්පත භාවිතා කර ගුවන් ටිකට්පත මිලදී ගෙන තිබුණි. එම දරන ලද වියදම පිළිබඳව පරීක්ෂා කිරීමකින් තොරව සහෝදරයා විසින් තැන්පත් කර තිබූ මුදලින් ඉතිරිව තිබූ රු.98,786ක් පමණක් 2023 අගෝස්තු මාසයේදී ඔහු වෙත ගෙවා තිබුණි. | කොරියානු තානාපති කාර්යාලය මඟින් යොමු කරන ලද ගිණුම් ලේඛනවලට අනුකූලව ශ්‍රමිකයා වෙනුවෙන් ඔහුගේ ඥාතීන් විසින් කාර්යාංශයේ තැන්පත් කර තිබූ මුදලින් නැවත ඔහු වෙත ගෙවිය යුතු මුදල රු.98,786 ක් ලෙස තහවුරු කර ගැනීමෙන් අනතුරුව මෙම ගෙවීම සිදු කර ඇති බව. | ශ්‍රමිකයාගේ එරට බැංකු ගිණුම්හි තැන්පත් මුදල් භාවිතා කර තිබේද යන්න හා කම්කරු සුභසාධන අංශයේ නිලධාරියෙකුගේ පුද්ගලික ණය කාඩ්පත භාවිතා කර ගුවන් ටිකට්පත මිලදී ගැනීම පිළිබඳව පරීක්ෂණයක් මඟින් තහවුරු කළ යුතුය. |

### 1.6.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 1985 අංක 21 දරන විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ | | | | |
| | i | 24(1) වගන්තිය | කාර්යාංශයේ ලියාපදිංචි බලපත්‍රලාභීන් නොවන පුද්ගලයින් විසින් ශ්‍රමිකයින් විදේශගත කරන බව පවසා මුදල් එක්රැස්කර කටාර් රාජ්‍ය වෙත ශ්‍රමිකයින් විදේශගත කිරීම සම්බන්ධයෙන් පැමිණිලි 11 කට ආසන්න ප්‍රමාණයක් විශේෂ විමර්ශන අංශය වෙත ලැබී තිබුණද එම පුද්ගලයින් සම්බන්ධයෙන් පනතේ 62 හා 63 වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2009 අංක 56 සහ 1994 අංක 04 දරන සංශෝධිත පනත් මඟින් සංශෝධිත 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතට අනුකූලව පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු සිදුකර ඇති බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | ii. | 28(1) (අ) වගන්තිය | ලියාපදිංචි බලපත්‍රලාභීන් හතර දෙනෙකු විසින් ව්‍යාජ රැකියා ඇණවුම් සකස් කර කටාර් රාජ්‍ය වෙත ශ්‍රමිකයින් විදේශගත කර තිබූ බවට එහි හිමිකරුගෙන් පැමිණිල්ලක් ලැබී ඇති බව 2023 අප්‍රේල් 17 දින සිට 2023 නොවැම්බර් 20 දින දක්වා වූ | නියෝජිත ආයතනයට එරෙහිව විමර්ශන කටයුතු අවසන් අදියරේ පවතින බැවින්, එම කටයුතු අවසන් වූ වහාම කටාර්හි තානාපති කාර්යාලයට වාර්තාවක් ඉදිරිපත් කරන බව. | කාර්යාංශ පනතට අනුකූලව බලපත්‍රලාභීන් විසින් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යා යුතු බවට අවධාරණය |

| | | | | |
|---|---|---|---|---|
| | | කාලපරිච්ඡේදය තුළදී පැමිණිලි ලැබී ඇති බවත්, එලෙස විදේශ ගත කරනු ලැබූ ශ්‍රමිකයෙකු 2024 මැයි 16 දින මිය ගොස් තිබූ බවත්, එහි වගකීම කිසිවකු බාර නොගත් බවත් තානාපතිතුමන් විසින් කාර්යාංශයේ සභාපති වෙත දන්වා තිබුණි. තවද ඒ පිළිබඳව විමර්ශනයක් කර, ඉක්මන් ක්‍රියාමාර්ගයක් ගෙන තානාපති කාර්යාලය දැනුවත් කරන ලෙස ලිපි 7ක් යොමුකර තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කර 2024 ඔක්තෝබර් 29 දින දක්වා වාර්තාවක් යොමු කර නොතිබුණි. | | කළයුතුය. |
| iii. | 44 වගන්තිය | ලියාපදිංචි බලපත්‍රලාභියකු විසින් කාර්යාංශය වෙත ඉදිරිපත් කර තිබූ රැකියා ඇණවුම් සඳහා ශ්‍රමිකයින්ගෙන් මුදල් අය කිරීමකින් තොරව විදේශගත කරන ලෙස කාර්යාංශය විසින් ලබා දී තිබූ අනුමැතිය අවභාවිතා කර 2022 වර්ෂයේ සිට බලපත්‍රලාභීන් නොවන පුද්ගලයින් විසින් ශ්‍රමිකයින් විදේශගත කිරීමට මුදල් අයකර ලියාපදිංචි බලපත්‍රලාභියාගේ රැකියා ඇණවුම් මඟින් ශ්‍රමිකයින් කාර්යාංශයේ ලියාපදිංචි කිරීම සඳහා ව්‍යාජ තොරතුරු ඇතුලත්කර විදේශගත කර තිබුණි. ඉන් රැකියාවන් නොමැතිව 50 දෙනෙකුට ආසන්න ප්‍රමාණයක් නැවත ලංකාවට පැමිණ කාර්යාංශය වෙත පැමිණිලි කර තිබූ බව විගණනය විසින් සිදු කරන ලද නියැදි පරික්ෂාවේදී නිරීක්ෂණය විය. එහෙත් කාර්යාංශය විසින් අදාළ බලපත්‍රලාභියාට හා මුදල් අයකරගත් පුද්ගලයින්ට එරෙහිව ලැබී තිබූ පැමිණිලි සම්බන්ධයෙන් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර අගතියට පත් පාර්ශ්වයන් වෙත සාධාරණ විසඳුමක් ලබාදී නොතිබුණි. | බලපත්‍රලාභියා විසින් සිදුකරන ලද කාර්යාංශ ලියාපදිංචිය සම්බන්ධයෙන් විමර්ශන අංශයට ලැබී තිබූ පැමිණිලි සම්බන්ධයෙන් කාර්යාංශ පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකර සිට ඇතැයි යන්න නිවැරදි නොවේ. කාර්යාංශය පනතේ 44 වන වගන්තිය අදාළ වනුයේ සමථකරණ ක්‍රියාවලියට පමණක් බවද, මෙහි සඳහන් කර ඇති ආකාරයට කාර්යාංශ පනතේ 44(4)1 වගන්තිය ප්‍රකාරව පැමිණිලිකරු සම්බන්ධයෙන් මුදල් ගෙවන ලෙස බලපත්රලාභියාට විධානයක් කළ නොහැකි අතර, කරන ලද විධානයක් සම්බන්ධයෙන් නඩු ගොනු කල යුතු ආකාරය දක්වා ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර අගතියට පත් පාර්ශවයන් වෙත සාධාරණ විසඳුමක් ලබාදිය යුතුය. |
| iv | 48(2) වගන්තිය | කාර්යාංශයේ විදේශීය සුභසාධන අරමුදල් කමිටු අනුමැතියකින් තොරව ඕමාන් දූත මණ්ඩල කාර්යාලයේ කම්කරු සුබසාධන අංශයේ උපදේශක විසින් ගෘහ සේවිකාවකගේ රෝහල් බිලක් පියවීම සඳහා 2023 ඔක්තෝබර් 22 | ගෘහ සේවිකාවගේ රෝහල් ගාස්තුව වශයෙන් ඕමාන් රියාල් 3000 ක මුදලක් ගෙවීම සඳහා කාර්යාංශයෙහි සභාපතිතුමා වෙතින් **WhatsApp** | පනතේ විධිවිධාන අනුව පූර්ව අනුමැතිය මත වියදම් දැරිය යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | දින රු.2,549,640 ක් ගෙවීම් කර තිබුණි. | පණිවිඩයක් මාර්ගයෙන් අනුමැතිය ලබා ගෙන ඇති අතර ඊට යටත්ව අදාළ ගෙවීම් සිදු කර ඇති අතර 2024.06.27 දින පැවැති විදේශීය සුභසාධන අරමුදල් කමිටු රැස්වීමේදී ඒ සඳහා කමිටුවේ අනුමැතිය ලබා දී ඇති බව. | |
| | v | 53(3) වගන්තිය | පනතේ විධිවිධාන වලට පටහැනිව ඇමෙරිකානු ඩොලර් 100ක් කාර්යාංශය වෙත තැන්පත් කිරීමෙන් අනතුරුව එක්සත් අරාබි එමිර් රාජ්‍යයට හා ඕමාන් රාජ්‍යයට රැකියා ගිවිසුමක් නොමැතිව සංචාරක වීසා මත ගෘහසේවිකාවන් විදේශගත කිරීමට 2023 මාර්තු 20 දිනැති සභාපති චක්‍රලේඛ අංක 07/2023 මඟින් කාර්යාංශයේ ලියාපදිංචි බලපත්‍රලාභීන්ට අනුමැතිය ලබාදී තිබුණි. එදින සිට 2024 ජූනි 6 දින වන විට රාජ්‍යයන් දෙකක් වෙත සංචාරක වීසා මත ගෘහ සේවිකාවන් 4,942 ක් විදේශගත කර තිබූ අතර ඉන් 3,954ක් වෙත චක්‍රලේඛය ප්‍රකාරව දින 30ක් ඉක්මයාමට පෙර රැකියාවක් ලබාදුන් බවට අදාළ ලියකියවිලි තානාපති කාර්යාලයේ තොරතුරු පරිගණක පද්ධතියට උඩුගත කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | පනතට අනුකූලව බලපත්‍රලාභීන් විසින් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යා යුතු බවට අවධාරණය කළ යුතුය. |
| (ආ) | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 1 වැනි කාණ්ඩයේ V වැනි පරිච්ඡේදයේ 4.3 හා 7.1 වගන්ති | 2019 සිට 2023 මාර්තු 10 දින දක්වා කම්කරු ලිපිකරුවෙකු ලෙස කුවේට් කම්කරු සුභසාධන අංශයේ සේවය කරන ලද නිලධාරියෙකු 2023 මාර්තු 09 දින සේවය අවසන් කර නැවත මාර්තු 15 දින සේවයට වාර්තා කර තිබුණි. ඔහු වෙත දූත මණ්ඩල සේවය සඳහා ලබාදී තිබූ කාර්යාලීය ගුවන් ගමන් බලපත්‍රය හා එරට තානාපති කාර්යාලය මගින් නිකුත් කර තිබූ හැඳුනුම්පත නැවත භාර දීමකින් තොරව හා විධිමත් අනුමැතියකින් තොරව එදින සිට නැවත සේවයට වාර්තා කර නොතිබුණු අතර මාර්තු 29 දින විදේශගත වී තිබුණි. ඒ | ඔහු විසින් කාර්යාංශයේ සේවයෙන් ඉල්ලා අස්වීමට ඉල්ලුම් කළද කාර්යාංශය විසින් එය පිළිනොගන්නා ලද නමුත් ඔහු සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් ආයතන සංග්‍රහයේ 5වන පරිච්ඡේදයේ 7:1 උපවගන්තිය අනුව, 2023.03.29 දින සිට බලපැවැත්වෙන පරිදි ඔහු ස්ව කැමැත්තෙන් සේවය හැර ගියා සේ සලකා කාර්යාංශය | ආයතන සංග්‍රහයේ විධිවිධානයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | සම්බන්ධයෙන් ඔහුට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට පටහැනිව පාරිතෝෂික ලෙස රු.514,055ක් 2023 අප්‍රේල් 06 දින ගෙවීම් කර තිබුණි. විදේශගතවී මාස 05 කට පසු එනම් 2023 සැප්තැම්බර් 21 දින සිට ස්ව කැමැත්තෙන් සේවය හැර ගියාසේ සලකා කටයුතු කරන බවට සාමාන්‍යාධිකාරී විසින් ලිපියක් නිකුත් කර තිබීමත්, පාරිතෝෂික මුදල් ගෙවීම් කිරීමත් විගණනයේදී ගැටළු සහගත විය. | කටයුතු කරන ලදි. එය ඔහු සම්බන්ධයෙන් ගනු ලැබූ විනය ක්‍රියාමාර්ගය බව. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතේ 13 වන වගන්තියට අනුව, පාරිතෝෂික අහිමි කළ නොහැකි බැවින් පාරිතෝෂික මුදල නියමිත දින ගෙවිය යුතු බව. | |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 135 හා 138 | 2022 ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ රු.4,176,085 ක් වටිනා ගෙවීම් වවුචර් පත් 21 ක් මුදල් රෙගුලාසි වලට පටහැනිව අනුමත කිරීම, නිර්දේශ කිරීම හා සහතික කිරීම යන සියළු කාර්යයන් ඕමාන් තානාපති කාර්යලයේ කම්කරු සුභසාධන අංශයේ තුන්වන ලේකම් විසින් සිදුකර තිබුණි. | 2020 හා 2021 වර්ෂයන්හි දී පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය මත දූත මණ්ඩලයන්හි සේවය කල කාර්යාංශ නිලධාරින් බහුතරයක් මෙරටට කැඳවන ලද අතර සේවය කරනු ලැබුවේ සීමිත සේවක සංඛ්‍යාවක් වන බැවින් ගෙවීම් වවුචරයක් පිළියෙල කිරීම, පරීක්ෂා කිරීම, නිර්දේශ කිරීම, අනුමත කිරීම හා සහතික කිරීම යන අංශ 05 ම ආවරණය කිරීම සඳහා නිලධාරීන් නොමැතිවීම හේතුවෙන් නිලධාරියෙකු හෝ තානාපතිතුමා මෙම ගෙවීම් වවුචර් අත්සන් කිරිමේ ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීම තුළින් මූල්‍ය පාලන ක්‍රමය සිදු කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2023 අප්‍රේල් 06 දිනැති අංක 01/2023 දරන සභාපතිගේ චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව 2023 වර්ෂයේදී දූත මණ්ඩල සේවය සඳහා පෙර දූත මණ්ඩල සේවයේ නිරතව සිටි කාර්යාංශයේ නිලධාරීන් 07 දෙනෙකු බඳවාගෙන තිබූ අතර, ඉන් දෙදෙනෙකු 3 වන හා 4 වන වතාවට දූත මණ්ඩල සේවය අවසන් කර පැමිණි නිලධාරීන් විය. තවද දූත මණ්ඩල | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව බඳවා ගැනීම් සිදු කළ යුතුය. |

සේවය අවසන් කර වසර 3 ක් කාර්යාංශයේ සේවය සම්පූර්ණ නොකරන ලද නිලධාරියෙකුද බඳවාගෙන තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සමූහයේ හා කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.5,079,664,980 ක සහ 4,927,579,629 ක බදු පසු ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු. 6,123.303,917ක සහ 6,085,612,304 ක බදු පසු ලාභයක් වී තිබුණි. ඒ අනුව සමූහයේ හා කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු1,043,638,937කින් සහ රු1,158,032,675 කින් පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වෙනත් ආදායම අඩුවීම , ප්‍රචාරණ වියදම් සහ සුභසාධන වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 ජූලි 25 දින දකුණු කොරියාව බලා පිටත්ව යාමට නියමිතව සිටි ශ්‍රමිකයින් 6 දෙනෙකු විසින් එදිනට නියමිත ගුවන්යානයේ ටිකට්පතක් රු.272,000කට හා ටිකට්පත් 5ක් රු.279,000 කට සෘජුවම ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙන් මිලදී ගෙන තිබුණු අතර විදේශ රැකියා ඒජන්සි සමාගමෙන් එම ටිකට්පත් රු.319,522 ක මිලකට මිලදී නොගැනීම හේතුවෙන් ඔවුන්ව එදින කොරියාව බලා පිටත් කර යැවීම අත්හිටුවා තිබුණි. ඉන් එක් ශ්‍රමිකයෙකු පමණක් නැවත රු.319,522 ක් ගෙවීමෙන් පසු එම ගුවන් යානයේම ද අනෙකුත් ශ්‍රමිකයින් 5 දෙනා ඉන් මාසයකට පසුව රු.329,291ක් බැගින් ගෙවා නැවත වරක් ටිකට්පත් මිලදී ගෙන යැවීමට කටයුතු කර තිබුණි. ඒ අනුව කාර්යාංශයේ ඉහළ කළමනාකාරිත්වය විසින් මෙම ශ්‍රමිකයින් 6දෙනා සඳහා ටිකට්පත් වෙනුවෙන් රු.1,961,225 ක් වැඩියෙන් වැය කිරීමට කටයුතු සලස්වා තිබුණි. | 2023.07.25 දින පිටත් වීමට නියමිතව සිටි 806 වැනි කණ්ඩායම සඳහා අදාළ දැනුවත් කිරීමේ වැඩසටහන 2023.07.17 දින පවත්වා ඇති අතර එහිදී කණ්ඩායමක් ලෙස ගුවන් ටිකට්පත් ලබා ගැනීම ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම වෙතින් සිදුකල යුතු බව අවධාරණය කර ඇති බව. එක් රැකියාලාභියෙකු නියමිත දින විදෙස්ගත නොවන බවත් අනෙකුත් රැකියාලාභීන් 06 දෙනා කාර්යාංශය විසින් ලබා දී තිබූ උපදෙස් වලට පටහැනිව ගුවන් ටිකට්පත් මිලදීගෙන ඇති බවත් තහවුරු වී ඇති බව. | ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගමින් ටිකට්පත් සෘජුව මිලදී ගැනීම සඳහා සමාගමට හැකියාව තිබියදී, පුද්ගලික නියෝජිතායතන හරහා මිලදී ගැනිම පිළිබඳව පරීක්ෂණයක් සිදු කර වැඩියෙන් අයකරන ලද මුදල් ශ්‍රමිකයින් වෙත නැවත ගෙවීම් කිරිමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කුවේට් දූත මණ්ඩල කාර්යාලයේ පිහිටි සුරක්ෂා නිවාසය 2021 මාර්තු 09 දින සිට මෙම ගොඩනැගිල්ලෙන් ඉවත් කර නිවාස පාදක නිලධාරියකුගේ නිවසක් ලෙස භාවිතා කිරීම හේතුවෙන් තානාපති සේවය අපේක්ෂාවෙන් පැමිණෙන ගෘහසේවිකාවන්ට රාත්‍රී කාලයේදී හා සති අන්තයේදී අදාළ ගැටළු විසඳා ගන්නා | සුරක්ෂා නිවාසය වසා දැමීමට තීරණය කර ඇත්තේ එවකට තානාපතිතුමන්ගේ අභිමතය පරිදි වන අතර, අනෙකුත් කටයුතු එනම්, කම්කරු හා සුභසාධන අංශයේ කටයුතු මෙන්ම සියරට පේරුව නිලධාරීන්ගේ නවාතැන් පහසුකම් ද පවත්වාගෙන යා යුතුව ඇත. එබැවින් | පීඩාවට පත්ව පැමිණෙන ගෘහසේවිකාවන්ට අදාළ ගැටළු විසඳා ගන්නා තෙක් නවාතැන් ගැනීමට සුදුසු ස්ථානයක් පවත්වාගෙන යා |

| | | | |
|---|---|---|---|
| | තෙක් නවාතැන් ගැනීමට සුදුසු ස්ථානයක් නොතිබුණි. තවද 2023 වර්ෂය සඳහා නිවාස පාදක නිලධාරීන් දෙදෙනාගේ නිල නිවාස සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ අනුමත කුලී ගාස්තු සීමාව ඉක්මවා රු.21,330,047 ක් වැඩිපුර ගෙවා තිබුණි. | භාවිතයට නොගෙන තිබූ සුරක්ෂා නිවාසය සුදුසු පරිදි සකස් කොට තෙවන ලේකම්ගේ නිල නිවස ලෙස භාවිතයට ගැනීමට කටයුතු කර ඇත. මේ සඳහා බාහිරින් නිල නිවසක් කුලියට ගතහොත් ඒ සඳහා වාර්ෂිකව අධික මුදලක් වැය කිරීමට සිදුවේ. (KD 4,032 = KD 336 x12 පමණ) මේ අනුව, මෙය අලුත්වැඩියා කර භාවිතයට ගැනීම තුළ වියදම් අඩුකර ඇති අතර, නිලධාරියා තානාපති කාර්යාලය තුළ රැඳී සිටීම හේතුවෙන් සේවය සැපයීමට පහසුවක් වන බව | යුතුය. |
| (ඇ) | කාර්යාංශයට අයත් ඕමාන් තානාපති කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලේ සුරක්ෂා නිවාසයක් පවත්වාගෙන යෑමේ හැකියාව පැවතියදී 2019 ඔක්තෝබර් 01 දින සිට 2024 ජූලි දක්වා කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලිවල පවත්වාගෙන ගොස් තිබුණු අතර 2024 ජනවාරි දක්වා දළ වශයෙන් (ඕමාන් රියාල් 34,000 ක් ) රු.28,561,112 ක් ගෙවා තිබුණි. තවද 2022 වර්ෂයේ අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළදී නවාතැන් ගෙන සිටි රැඳවියන් විසින් සුරක්ෂා නිවාසයට සිදුකරන ලද අලාභහානි අලුත්වැඩියාකර හිමිකරු වෙත භාරදීම ප්‍රමාද වූ 2023 පෙබරවාරි සිට අගෝස්තු දක්වා වූ මාස 7ක කාලපරිච්ඡේදය වෙනුවෙන් කුලී ගාස්තු, ජලබිල්පත් , විදුලි බිල්පත් හා අලාභහානි සඳහා රු.19,130,480 ක් ගෙවා තිබුණි. | කාර්යාංශය වෙත සාවද්‍ය තොරතුරු සපයමින් අවිධිමත් මාර්ග ඔස්සේ සංචාරක වීසා භාවිතයෙන් රැකියා සඳහා ඕමාන් රාජ්‍ය වෙත පිටත්ව ගිය කාන්තා විගමනිකයින් විසින් සිදු කරන ලද කලහකාරී තත්ත්වය මත ඇති වූ අලාභය හා වැහි වතුරින් සිදුවූ හානිය වෙනුවෙන් විශාල මුදලක් ගෙවීමට සිදු විය. ගොඩනැගිල්ලට සිදු වූ අලාභහානිය පිළිබඳ පරීක්ෂණය තානාපති කාර්යාල නිලධාරීන් හා ගොඩනැගිලි හිමිකරු එක්ව පැවත්විය යුතුව තිබූ බැවින් පරීක්ෂණ ප්‍රමාද වීම සිදුවූ අතර, ගොඩනැගිලි හිමිකරු වෙනුවෙන් පෙනී සිටි පාර්ශවයේ සිදු වූ ප්‍රමාදය හේතුවෙනි. තවද ගෙවීමට සිදු වූ අලාභය වෙනුවෙන් විශාල මුදලක් ගෙවීමට සිදු වූයේ එම ගොඩනැගිල්ල නවීන උපාංගයන් යොදා ගොඩනගන ලද විදුලි සෝපාන සහිත තට්ටු 03 ක නවීන ගොඩනැගිල්ලක් වීම නිසා බව. | විදේශයන්හි පවත්වාගෙන යනු ලබන සුභසාධන අංශය විධිමත් කාර්යය මණ්ඩලයක් සහිතව පවත්වා ගෙන යායුතු අතර මෙම සිදුවීම පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |
| (ඈ) | ඕමාන් විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් සුරක්ෂා නිවාසයක් ලෙස භාවිතා කිරීමට අනුමැතිය ලබාදී නොතිබුණු ගොඩනැගිල්ලක් 2023 වර්ෂය සඳහා කුලී පදනම මත ලබාගෙන ගිවිසුම් ගත වීමකින් තොරව ඕමාන් රියාල් 7200 ක් හෙවත් රු.6,872,544 ක් ගෙවා තිබුණි. | ගිවිසුම අත්සන් කිරීමෙන් පසු එය ඕමාන්හි විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ලියාපදිංචිය සඳහා යොමු කර ඇත. එසේම විදේශ කටයුතු අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම අදාළ ගිවිසුම අත්සන් කිරීමෙන් අනතුරුව සිදුකළ යුතු කාර්යයක් බැවින් ගිවිසුම අත්සන් කරන අවස්ථාව වන විට විදේශ කටයුතු අමාත්‍යාංශයේ තීරණය දැනගැනීමට අවස්ථාවක් නොමැත. එසේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ අනුමැතිය නොලැබුණද ගොඩනැගිලි හිමිකරුගේ එකඟතාවය මත හා සුරක්ෂා නිවාසයක් පවත්වා ගෙන | විධිමත් ගිවිසුම් ගතවීමක් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | | යාම අවශ්‍යතාවය මත සුරක්ෂා නිවහන පවත්වාගෙන ගොස් ඇති බව. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කකළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගෘහස්ථ අංශයේ රැකියාවන් සඳහා ප්‍රථමවරට විදේශගත වන ගෘහසේවිකාවන්ට බෙදා දීම සඳහා රු.5,000 ක් හා රු.2,500 ක් වටිනා සතොස තෑගි වවුචර්පත් පිළිවෙලින් 14,000 ක් හා 28,000 ක් සියයට 1ක වට්ටමක් යටතේ රු.138,600,000 කට 2023 ඔක්තෝබර් 13 දින මිලදී ගෙන තිබුණි. 2024 අගෝස්තු 14 දින වන විට ඉන් රු.128,229,300 ක් වටිනා වවුචර් පත් 13,005ක් ඉතිරිවී තිබුණි. ප්‍රථම වතාවට විදේශ ගත වන කාන්තාවන් පෙර විදේශ ගතව සිටි බවට ලියකියවිලි ඉදිරිපත් කර පුහුණුවෙන් නිදහස් කර තිබීම හා උත්සවය පැවැත්වීම ප්‍රමාදවීම මේ සඳහා හේතු වී තිබුණි. | මෙම වැඩසටහන 2023 ක්‍රියාකාරි සැලැස්ම තුළ ඇතුළත් නොවූ අතර, නව ක්‍රියාකාරකමක් ලෙස 2023 ජූනි 19 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මඟින් අනුමැතිය ලබා ගෙන ඇති බව. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම 2023 .11.24 දින සිට ආරම්භ කිරීමට සිදු වූ අතර. 2023 දෙසැම්බර් 31 දිනට වවුචර්පත් 52ක්ද, 2024 අගෝස්තු මස 31 දින වන විට වවුචර්පත් 1670ක් බෙදා දී ඇති බව. | ක්‍රියාකාරි සැලැස්ම තුළ ඇතුළත් වැඩසටහන් අප්‍රමාදව ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | 2022 ජූනි 07 දිනැති කාර්යාංශයේ සභාපතිගේ ලිපියට හා 2023 ජනවාරි 09 දිනැති නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුහුණු) ලිපියට පටහැනිව පළමු වතාවට විදේශ ගතවන ගෘහ සේවිකාවන් සඳහා රු.22,410 ක් ගාස්තුවක් අය කර දින 28 ක (NVQ Level 3) නේවාසික පුහුණුවක් ලබා නොදී 2023 ජනවාරි සිට 2024 මැයි 29 දින දක්වා කාල පරිච්ඡේදය තුළදී ගෘහ සේවිකාවන් 28,165 දෙනෙක් පළමු වතාවට විදේශ ගත කර තිබීම හේතුවෙන් රු.631,177,650ක පුහුණු ආදායමක් කාර්යාංශයට අහිමි වී තිබුණි. | අදහස් දක්වා නොමැති බව. | අභ්‍යන්තර උපදෙස් පත්‍රිකා අනුව කටයුතු කළ යුතු අතර චක්‍රලේඛවලට අනුගතව කටයුතු නොකිරීම පිළිබඳව විශේෂ පරීක්ෂණයක් සිදුකළ යුතුය. |
| (ඇ) | 2022 ඔක්තෝබර් 15 හා 16 දෙදින, ගාල්ල සමනළ උයනේදී පැවති වැඩසටහන සඳහා වෙළඳ කුටියක් රු.170,000 බැගින් හා 2023 ජූලි 15 හා 16 දිනයන්හි යාපනය දිස්ත්‍රික්කයේ පැවති වැඩසටහන සඳහා කුටියක් රු.500,000 බැගින් පිළිවෙලින් කුටි 30ක් හා කුටි 25ක් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරිමකින් තොරව පුද්ගලික | මෙම වැඩසටහනට අදාළ වෙළඳ කුටි ලබාදීම සඳහා ප්‍රසම්පාදන කාර්යය සිදු කර ඇත්තේ රේඛීය අමාත්‍යාංශය විසින් වන අතර, ප්‍රධාන ගණන්දීමේ නිලධාරි ලෙස අමාත්‍යාංශ ලේකම් විසින් යොමු කරන ලද 2023 මැයි 29 දිනැති ලිපිය අනුව සිදු කරන ලද බව. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකිරීම සම්බන්ධව විශේෂ පරීක්ෂණයක් සිදුකළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | ආයතනයකින් ලබාගෙන තිබුණි. ඒ අනුව කුටියක මිල රු.330,000කින් වැඩිවීම පිළිබඳව අවධානය යොමු කිරීමකින් තොරව 2023 මැයි 29 දිනැති කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය පදනම් කරගෙන කුටි 25 වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් වෙත රු.12,500,000ක් ගෙවීම් කර තිබුණි. | | |
| (ඇ) | 2013 ජනවාරි 24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය සමඟ ඒකාබද්ධව රටවිරුවෝ නිවාස ණය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා වසර 05 කට අවබෝධතා ගිවිසුමක් අත්සන් කර කාර්යාංශය විසින් 2013 මාර්තු 08 දින රු.100,000,000 ක මුදලක් සමෘද්ධි අධිකාරිය නමින් ස්ථාවර තැන්පතුවක තැන්පත් කර තිබුණි. අවබෝධතා ගිවිසුමේ කාලය 2018 මාර්තු 07 දිනෙන් අවසන් වී ඇතත්, එම මුදල් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් මෙම මුදල අයකර ගැනීම සඳහා කැබිනට් පත්‍රිකාවක් සකස් කර කැබිනට් මණ්ඩලය වෙත යොමු කර ඇති බව. | අවබෝධතා ගිවිසුම අනුව මෙම මුදල් ව්‍යාපෘතිය සඳහා යොදවා තිබේද යන්න තහවුරු කර ගත යුතු අතර, අදාළ තැන්පත් මුදල නැවත ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන චක්‍රලේඛයෙහි ක්‍රියාකාරී අත්පොතේ 6.6 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, කාර්යාංශය විසින් දින 100 ක් ප්‍රමාද වී 2023 ජූනි 10 දින මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණනය වෙත ලබා දීමට නොහැකි වූයේ ප්‍රධාන කාර්යාලය, පුහුණු මධ්‍යස්ථාන, පළාත් කාර්යාල හා ගුවන් තොටුපල ඒකකයෙහි ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කර අවසන් වී නොතිබුන බැවින් වන අතර ඉදිරි වර්ෂයේදී නියමිත දිනට ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |